# 7 පාඩම - ලෙන අතහැර යාම.

- **ඉගෙනුම් ඵල :-**
    - උපදෙස් අනුව නාට්‍ය පෙළ කියවයි.
    - පෙළ පොතට නියමිත කොටස හඳුනා ගනියි.
    - නියමිත ගීත තාලානුරූපව ගායනා කරයි.
    - සිංහයාගේ චරිත ලක්ෂණ විස්තර කරයි.

1. පෙර ක්‍රියාකාරකම සිහියට නගා ගන්න.
2. මීළඟට ඔබ කළ යුතු වන්නේ සාහිත්‍ය සංග්‍රහය පෙළ පොතේ 62 – 69 පිටු කියවීමයි.
3. පෙළ පොතේ ඇති කොටස අයත් වන්නේ ජවනිකා අංක කියටදැ'යි සටහන් කරන්න.
4. නාට්‍යය නැරඹීමෙන් හා පෙළ පොත කියවීමෙන් පසු ඔබ වඩාත් සංවේදී වූ චරිතය පිළිබඳව විස්තර කරන්න.
5. අනතුරුව නාට්‍යයේ පෙළ පොතට නියමිත කොටස් ඇතුළත් චරිත පිළිබඳව කෙටි විස්තර ලියන්න.
6. සිංහයාගේ සිංදුව ශබ්ද නගා ගායනා කරන්න.
7. සිංහයා හා තම දරුවන් ගල්ලෙනෙහි ගත කර ඇති ජීවිතය කෙබඳු වූයේ දැ'යි සිතන්නේ ද? ඒ පිළිබඳ විස්තර ලියා දක්වන්න.
8. සිංහබාහු නාට්‍ය කෘතිය සොයා කියවන්න. නාට්‍යයේ එන කතාව ලියා දක්වන්න.

- **ඉහත ක්‍රියාකාරකම සඳහා භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක :-**
    - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍ය පෙළ
    - youtube - https://youtu.be/InhrCitmixs

**ඇගයීම**

❖ පහත දැක්වෙන ප්‍රකාශයන් කා විසින් කා හට ප්‍රකාශ කරන ලද ද? කිනම් අවස්ථාවකදී ද?

| ප්‍රකාශය | කවුද? | කාටද? | අවස්ථාව |
|---|---|---|---|
| 1. "අප කැඳවූයේ කිමද කියා දැනගනු කැමැත්තෙමු" | | | |
| 2. "වළකන්ට බැරි දේට පිහිට වනු දෙවියනේ මා අසරණ නොකර" | | | |
| 3. "කුමක්දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ" | | | |